

# ඩී.බී.ගේ සාහිත්‍ය සේවාව 5

## පැතිකඩ



ආචාර්ය පාලිත ගණේවත්ත

## සිංගරු සිරිත

ඩී. බී. කුරුප්පු මහතා 2001 දී 'සිංගරු සිරිත' නමින් පොතක් ලියා පළ කළේය. එය විවිධ මාතෘකා 32ක් ඔස්සේ ලියූ උපහාසාත්මක ලිපි එකතුවකි. පොත අරඹමින් කතුවරයා මෙසේ ලියයි.

"සිංගරු යනු කැන්ගරු දේසේ නිපන් වදනකි. සිංහ සහ කැන්ගරු යන දෙපදය වක් වීමෙන්... සිංගරු කැන්ගරු දේසේම වසන්නෝය. සිංගරු සිරිත රඟදක්වනුයේ කැන්ගරු දේසේ ඔවුන්ට හිමි අඩවියේ ය." (පිටු 1)

සිංගරු සිරිතේ පිට කවරයේ උඩින් හා මැදින් සතුන් පේළි දෙකකි. උඩ පේළියේ සිංහයන්ය. මැද පේළියේ කැන්ගරුන්ය. උඩ පේළියේ සිංහයන්ගේ සිංහ හිසට කැන්ගරු බඳ බද්ධ වී ඇත. මැද පේළියේ කැන්ගරුන්ගේ හිසට සිංහ බඳ බද්ධ වී ඇත.  මේ පිට කවරය විජය වික්‍රම කරුණාසේන ගේ නිර්මාණයකි.

කැන්ගරු දේශය හා ශ්‍රී ලංකාව අතර භූගෝලීය සමාන අසමානකම් මෙන්ම දේශපාලකයන්ගේ සමාන අසමානකමද පොතේ මුල් ලිපි කිහිපයෙන් විස්තර කර ඇත. මීට දශකයකට පමණ පෙර පෝලින් හැන්සන් මහත්මිය ඕස්ට්‍රේලියාවේ තිබිය යුත්තේ බහු සංස්කෘතියක් නොව කිතු දහම මුල් කරගත් සුදු මිනිසාගේ සංස්කෘතිය පමණක් යයි නිවේදනය කළාය. ඇය මේ සංකල්පය සඳහා මූලාශ්‍ර කරගන්නට ඇත්තේ ශ්‍රී ලංකාවේ දාර්ශණිකයන් විසින් බිහි කරන ලද ජාතික චින්තනය යයි කතුවරයා උපහාසයෙන් යුතුව කියයි.

පොතේ මුල් කොටසින් ඩී. බී. මෙරටට ආ සිංහලයන්ගේ කුඩුකේඩුකම්, අමන ගති, පර ගති, හණමිටි අදහස්, මෝඩකම්, බොරු මානය, උද්දච්චකම ආදී දුබලතා විස්තර කරන්නේ ද්වේෂයෙන් තොරව කට කොනක නගාගත් සිනහවක් ද ඇතිවය. මෙරටදී ඇතැම් සිංහලයෝ මඟ තොටේදී තවත් සිංහලයා මුණ ගැසුනහොත් අමක බලා ගනිති. නැත්නම් නොදැක්කා මෙන් සිටිති; සිංහලෙන් කතා කරනු ඇසුනොත් ඔවුන් මග අරිති; සිංහලෙන් කතා කරමින් සිටියදී දුර සිට සිංහලයෙකු සේ පෙනෙන අයකු එනු දුටුවහොත් කතාව වහා ඉංග්‍රීසියට හරවති. මෙහි පැමිණි ඇතැම් සිංහලයෝ ඉංග්‍රීසි උච්චාරණයට ගැලපෙන පරිදි තම නම්ගම් පවා වෙනස් කරති. මෙරට පැමිණ ටික කලකින්ම සිංහල අමතක වූ බව බොරුවට මවා පෑමට උත්සහ කරති; අමාරුවෙන් මෙන් වරද්ද වරද්දා ඉංග්‍රීසි තාලයට සිංහල වචන උච්චාරණය කරති; තමන් ශ්‍රී ලංකාවේ කළ රැකී රක්ෂා ගැන දැරූ ඉහළ තනතුරු ගැන බොරු පුරසාරම් දොඩවති; මෙරටට පැමිණි කාලය අනුව මෙරට සිංහලයන් අතර පන්ති භේදයක් ඇති කිරීමට තැත් කරති. සිංහලයන්ගේ මෙවන් දුබලතා ගැනයි සිංගරු සිරිතේ මුල් ලිපි කිහිපයෙන් ඩී. බී. විවේචනය කරන්නේ.

මෙරට පැමිණෙන ඇතැම් සිංහලයන් මෙරට සමාජ සිරිත් ඉවක් බවක් නැතිව අනුකරණයට පෙළඹෙති. මිස්ටර්, සර් ආදී ගරුසරු වදන් නැතිව සියල්ලන්ට තමන්ම අමතති; දූ දරුවන්ගේ විසි එක් වන උපන් දින මහ ඉහළින් සමරති; තම ස්වාමි පුරුෂයන්ගේ පනස් වන උපන් දිනය ඔහුට නොදන්වා ඔවුන් තුල විස්මය දනවන අයුරින් හොර රහසේ සංවිධානය කරති; වයසට යන දෙමාපියන් වැඩිහිටි නිවාසවල

> *මෙහි පැමිණි ඇතැම් සිංහලයෝ ඉංග්‍රීසි උච්චාරණයට ගැලපෙන පරිදි තම නම්ගම් පවා වෙනස් කරති. මෙරට පැමිණ ටික කලකින්ම සිංහල අමතක වූ බව බොරුවට මවා පෑමට උත්සාහ කරති; අමාරුවෙන් මෙන් වරද්ද වරද්දා ඉංග්‍රීසි තාලයට සිංහල වචන උච්චාරණය කරති;*

නතර කිරීමටත් මව් දිනයේදී හා පිය දිනයේදී මල් පොකුරක් රැගෙන ඔවුන් බැහැ දකින්නට යාමත් අමතක නොකරති.

මේ සියල්ල සාවද්‍ය යයි ඉවත දැමිය නොහැකිය. මෙරට ජීවත්වන සිංහල අල මෙරට සමාජ සංස්කෘතික පරිසරයට අනුරූපව ජීවත් විය යුතුය. කවර රටකට පැමිණියත් ජන සමාජයට අහිතකර දෑ බැහැර කර හොඳ දේ යහපත් සිරිත් විරිත් හා ජීවිත පිළිවෙතකට හැඩ ගැසීමේ වැදගත්කම ඩී.බී. අවධාරණය කර ඇත.

ඩී.බී. මෙරටට ආ සිංහලයන්ගේ දුබලතා ...... උපහාසයට ලක් කරන්නේ ඒ දුබලතා මෙරටට කරපින්නාගෙන සිංහලයාට ගැරහීමට නොවේ. "මේ රටට ඇවිල්ලාවත් මේ දුබලතා අත් හැර මෙරට සමාජයේ හොඳ දේ වැළඳගන්ට බැරි කුමක් නිසාද" වැනි යටි අදහසද ඇතුවය. මේ දුබලතා හෙළි කිරිමෙන් පසුව මෙරට සමාජයෙන් අප උගත යුතු සාධනීය ගති පැවතුම් ගැන විශේෂ අවධානයක් යොමු කර තිබිමෙන් මේ බව තහවුරු වෙයි.

මෙරටට ආ සිංහලයන්ගේ දුබලතා උපහාසයට ලක් කරන කතුවරයා මෙරටට පැමිණීමෙන් පසුවද අත් නොහරන ලද සිංහල සිරිත විරිත් ගැන සුහද සිතින්

> *ඩී.බී. මෙරටට ආ සිංහලයන්ගේ දුබලතා ...... උපහාසයට ලක් කරන්නේ ඒ දුබලතා මෙරටට කර පින්නාගෙන සිංහලයාට ගැරහීමට නොවේ. "මේ රටට ඇවිල්ලාවත් මේ දුබලතා අත් හැර මෙරට සමාජයේ හොඳ දේ වැළඳගන්ට බැරි කුමක් නිසාද" වැනි යටි අදහසද ඇතුවය. මේ දුබලතා හෙළි කිරිමෙන් පසුව මෙරට සමාජයෙන් අප උගත යුතු සාධනීය ගති පැවතුම් ගැන විශේෂ අවධානයක් යොමු කර තිබිමෙන් මේ බව තහවුරු වෙයි.*

විස්තර කරයි. මෙරටට ආ බොහෝ සිංහලයෝ නැකැත් බලා අවුරුදු චාරිත්‍ර ඉටුකිරීමට වග බලා ගනිති. බෞද්ධ විහාරස්ථානවලට ගොස් දානමාන පිළිගැන්වීමට ද සීල භාවනා හා ආමිස පූජාවල යෙදීමටද දැඩි උනන්දුවක් දක්වති. වෙසක් පුන් පොහෝ දින වෙසක් සැරසිලි කිරීමෙන් හා තොරන් බැඳීමෙන් මෙරට උපන් දූ දරුවන්ට වෙසක් අසිරිය පිළිබඳ හැඟීමක් ඇතිකරවති.

විවිධ හේතුන් නිසා මෙරටට සංක්‍රමණය වූ සිංහලයෝ මෙරට උපන් තම දූ දරුවන්ට සිංහල බස උගන්වා සිංහල සංස්කෘතික අංග ගැන අවබෝධයක් ලබාදීමට උත්සුක වෙති. මෙවැනි සිංහලයන් 'සිංගරු සිරිත' කියවා කෝපයට පත්වීමට ඉඩ තිබේ. එවන් කෝපයක් ඇතිවීම එක් අතකින් සාධාරණය. එහෙත් මැදහත් සිතින් සිංගරු සිරිත කියවන්නකු කතුවරයාගේ අවංක අදහස් පිළිබඳ අවබෝධයක් ලබනු ඇතැයි සිතමි.

ඔය අමනකම්, මෝඩකම්, කුහකකම් අත්හැර ගැනීමට මේ රටින් හොඳ පාඩම් රැසක් ඉගෙන ගැනීමට පුළුවන්. එය නොකරන්නේ ඇයි ? යන ප්‍රශ්නය යි කතුවරයා නගන්නේ. වින්ස්ටන් ඩි පෝල්, සීමන් ෆැමිලි ආදී මේ රටේ පුණ්‍යායතනවලින් මෙරටට පැමිණෙන නව සංක්‍රමණිකයෙක්ට ම ලැබෙන්නේ මහඟු පිටුවහලකි. ඕස්ට්‍රේලියානුවෝ ධන බලය හෝ නිල බලය නොතකා නිස්සරණාධ්‍යාශයෙන් පිටරටවල විපතට පත්වූවන්ට ස්වේච්ඡාවෙන්ම සේවය ලබාදෙති. ඕස්ට්‍රේලියානුවන් තුළින් පිළිබිඹු වන මේ නිහතමානය අපට හොඳ ආදර්ශයක් නොවන්නේද ?

සිංගරු සිරිතේ අවසන් ලිපි කිහිපය මෙරට බෞද්ධ විහාරස්ථාන ගැනත් බුදු දහමේ විවිධ ස්වරූප ගැනත් අපගේ අවධානය යොමු කරන වැදගත් කරුණු අඩංගු ලිපි කිහිපයකි. එහෙත් ඒ ලිපි දෙක සඳහා යොදාගත් හාස්‍යජනක බස් වහර ඒ පිළිවලින් හෙළිකරන අර්ථාවබෝධයට බාධා කරන තරම් දඩබ්බරය. උපහාසය දනවන දඩබ්බර බස් වහර මිනිස් දුබලතා සඳහා සිනහවකින් යුතුව හෙළිකිරීමට උචිතය. දාර්ශණික අදහස් උපහාසය මුසුව ඉදිරිපත් කිරීමේදී උපහාස රසය යටපත්ව අර්ථය ඉස්මතු වන පරිදි බස් වහර සකස්විය යුතු යයි මම සිතමි.

මෙරටට පැමිණි සිංහලයන් මෙරට ඔසී සමාජයට අනුගතවීමේ වැදගත් කමක්ද ඩී.බී. සිංගරු සිරිතේ අවධාරණය කර තිබේ. 'ඔහු සංස්කෘතික හවුල් කරුවෝ, ආසියාවේ සුදු ගෝත්‍රය, 'ක්‍රිකට්' යන මාතෘකා යටත් ඇති ලිපි මේ සම්බන්ධයෙන් අපගේ අවධානය යොමු කරයි. ඕස්ට්‍රේලියාව හා ශ්‍රී ලංකාව අතර මෙරටදී ක්‍රිකට් තරඟයක් පැවැත්වෙන විට සිංහල අප සහාය දක්වන්නේ කුමන කණ්ඩායමටද ? වැඩියෙන් ප්‍රීති ඝෝසා නගන්නේ ශ්‍රී ලංකා පිල් හතරේ පහරකට ද ? ඕස්ට්‍රේලියානු පිලේ හතරේ පහරකට ද ? මීට වසර 5000කට පෙර සිටම මෙරට වසන ආදී වාසීන්, වසර දෙසීය ගණනකට පෙර මෙරටට පැමැණි සුදු ජාතිකයන් හා වසර විසි තිස් ගණනකට පෙර මෙහි පැමිණි සිංහලයන් අතර අන්‍යෝන්‍ය සබඳතාවය පවත්වාගත හැක්කේ කෙසේද ? තව වසර 50කින් පැමිණි පසු මෙරටට පැමිණෙන සිංහලයන් සිංගරු සිරිත කියෙව්වේද ? ඔවුන් තුළ කුමණ අදහසක් ඇතිවේද ඩී. බී. ගේ සිංගරු සිරිත මෙවන් කරුණු ගැන අපගේ අවධානය යොමු කරයි.


රාජ්‍ය සම්මාන ලාභී තරංග දන්දෙනිය මෙහෙය වන

# චින්තන රංග පාසල

විධාබර එදින්එදා ජීවිතයට නැවුම් බවක්
ප්‍රායෝගික සහ න්‍යායාත්මක දැනුමක්

වේදිකාව පමනක් නොව
ගුවන්විදුලිය සහ රූපවාහිනි මාධ්‍යයන්හි ද පරිචයක් ලබන්නට

රංගනය

පෙළ රචනය

රූප රචනය

අධ්‍යක්ෂනය

සහ

මාධ්‍යය තාක්ෂණය

ඇතුලූ අනෙකුත් අනුෂාංගික අංගයන් ද

විෂය ප්‍රවීනයන්ගේද සහභාගිත්වයෙන් ඉගෙන ගන්නට

අගෝස්තු මස සිට ඉරුදින උදෑසන

**Black Flat Community Centre**
**Cnr Waverley and Springvale Roads**
**Mel Ref 71C4**

ඇමතීම් තරංග **0433707241**

**dan.thara@yahoo.com**

Advanced Certificate (Television Production & Video Technology) National Youth Centre
Certificate (Radio Production & Script Writing) SLBC
Advanced Diploma (Theatre & Drama) Tower Hall Theatre Foundation,
B.A (Hons) (Theatre & Drama) University of Kelaniya
M. A. by Research (Theatre & Drama) La Trobe University